086

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්‍ෂණය - 2008

**ESC 2316-** පෙර පාසල් ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ ක්‍රම හා කළමනාකරණය

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 අගෝස්තු 17 වන දින වේලාව - ප.ව.01.30- ප.ව.04.30

---

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටත්, දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්ණ තුනකටත් (03) පිළිතුරු සපයන්න.**

## පළමු කොටස

01. කළමනාකරණය යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න.

02. ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා කෙරෙහි බලපාන සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පෙර පාසලක දෛනික වැඩ සැලසුම් කිරීමෙන් ගුරුවරයාට ලබාගත හැකි ප්‍රයෝජන 05 ක් ලියන්න.

04. ළමයින් තක්සේරු කිරීම සඳහා පෙර පාසල තුළදී ගුරුවරයා අනුගමනය කරන ක්‍රම 05 ක් සඳහන් කරන්න.

05. පෙර පාසල් වයසේ පසුවන ළමුන්ගේ මූලික අවශ්‍යතා 05 ක් සඳහන් කරන්න.

06. ක්‍රියාකාරකම් සඳහා පෙර පාසල් ළමුන් කණ්ඩායම් කරන ආකාර 05 ක් ලියා දක්වන්න.

07. පෙර පාසලක පවත්වාගෙන යායුතු රාජකාරි ලියකියවිලි වර්ග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

08. "ළමා රුචි අරුචිකම් අනුව පෙර පාසලක ක්‍රියාකාරකම් සැලසුම් කිරීම ඉතා වැදගත් වේ." මෙම ප්‍රකාශය පිළිබඳ කෙටියෙන් අදහස් දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. I පෙර පාසල් ඉගෙනුම් ඉගැන්වීම් වැඩ සටහනක් සැලසුම් කිරීමේදී අවධානයට ලක් වි යුතු සාධක 3 ක් නම් කරන්න.

(ලකුණු 03 යි)

ඉන් එක් සාධකයක් පෙර පාසල් ඉගෙනුම් ඉගැන්වීම් වැඩ සටහනක් සැලසුම් කිරීමේදී වැදගත් වන අයුරු සුදුසු නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 07 යි)

II. පෙර පාසල් ළමුන්ගේ උපරිම සහභාගිත්වය ලබා ගැනීමට හැකිවන ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කරන අයුරු උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

10. I. පෙර පාසලක සිදුකරන ඇගයීම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

II. ඇගයීම් කාර්ය සඳහා වාර්තා පවත්වාගෙන යැමෙන් ගුරුවරයාට ලැබිය හැකි ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05 යි)

III. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේදි ස්වයං ඇගයීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

11. I. "සම්පත්" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05 යි)

II. පෙර පාසලක් පවත්වාගෙන යැම සඳහා අවශ්‍ය කරන සම්පත් වර්ග 05 ක් ලියන්න. (ලකුණු 05 යි)

III. පෙර පාසලක සාර්ථක ක්‍රියාකාරීත්වය සඳහා ඔබ ඉහත සඳහන් කල සම්පත් වර්ග දෙකක් ඉවහල්වන අයුරු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

12. I. ළමා ක්‍රියාකාරකම් සඳහා පෙර පාසලක තිබිය යුතු ඉගෙනුම් ද්‍රව්‍ය පහක් නම් කරන්න.

(ලකුණු 05 යි)

II. එම ඉගෙනුම් ද්‍රව්‍ය ළමා සංවර්ධනයට උචිත වන සේ ප්‍රයෝජනයට ගන්නා අයුරු විස්තර කරන්න.

(ලකුණු 15 යි)

13. I. පෙර පාසලක් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යෑමේදී ප්‍රජාවගේ භූමිකාවේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

II. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධව රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය භාරය අගයන්න.

(ලකුණු 10 යි)

14. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. දෛනික වැඩ සැලසුම් කිරීම.

II. සම්පිණ්ඩිත ඇගයීම

III. වර්තමානයේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධ ශ්‍රී ලංකාවේ පවත්නා ගැටළු

(ලකුණු 10 x 2 = 20 යි)

- හිමිකම් ඇවිරිණි. -